The Journal of Archaeology and Heritage Studies (JAHS) 9 (I) 2022: 23-31 pp

The Journal of ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://fssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# බුවනෙකබාහු රජතුමාගේ පදීදොර තඹ සන්නස පිළිබඳ අධ්‍යයනයක්

**හසිත චාමිකර ගුණසිංහ**

කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. hasithac@kln.ac.lk

ARTICLE INFO

*Article history:*
Received 09 February 2023
Accepted 03 November 2023
Available online 29 December 2023

**සංක්ෂිප්තය**

සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ කප්පාගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පදීදොර සිරිසඟබෝ ශ්‍රී බුවනෙකබා රජමහ විහාරයේ ඉතිහාසය හැදෑරීමේ දී පදීදොර තඹ සන්නසට හිමිවන්නේ ඉහළ වැදගත්කමකි. ‘ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු’ නම් රජතුමා විසින් විහාර කර්මාන්ත කරවා, විහාරයේ නඩත්තුවට ගම්වර පූජා කරවන ලදැයි එහි සඳහන් වී තිබේ. මෙම අධ්‍යයනයේ දී අධ්‍යයන ගැටලුව බවට පත්වූයේ පදීදොර තඹ සන්නස ප්‍රදානය කරන ලද්දේ කිනම් රජතුමා ද යන්න නිශ්චිතව හඳුනාගැනීමයි. ඒ සඳහා අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදාගන්නා ලදී. පදීදොර තඹ සන්නස ආරම්භ වන්නේ ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු නම් රජතුමා විසින් විහාර කර්මාන්ත කරවන ලද ආකාරය සහ විහාරයේ නඩත්තුවට පූජා කළ ගම්වර දැක්වෙන විස්තරයෙනි. ඉන් අනතුරුව විහාර පූජාව සඳහා බාධා පමුණුවන්නන් හට අත්වන විපාක දැක්වෙන ශාප පාඨයකි. පදීදොර තඹ සන්නස ප්‍රදානය කරන ලද ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු රජතුමා යනු කෝට්ටේ සයවැනි බුවනෙකබාහු රජතුමා (ක්‍රි.ව. 1469-1477) බව පදීදොර විහාරය ආශ්‍රිත ජනප්‍රවාද මෙන්ම කෝට්ටේ යුගයේ සන්නස් සහ ශිලාලේඛන ආදියෙන් තහවුරු කරගත හැකිය. රජතුමා මෙම විහාර පූජාව සිදු කර ඇත්තේ බ්‍රාහ්මණ පරපුරකින් පැවත එන භික්ෂුවකට වීම ද විශේෂත්වයකි.

**මුඛ්‍ය පදඃ** පදීදොර රජමහ විහාරය, කෝට්ටේ යුගය, සයවන බුවනෙකබාහු, සන්නස්

## 1. හැඳින්වීම

පදීදොර සිරිසඟබෝ ශ්‍රී බුවනෙකබා රජමහ විහාරය, සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ කප්පාගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉපැරණි විහාරස්ථානයකි (සිතියම 01). පැරණි බෙදීම්වලට අනුව විහාරය අයත්වන්නේ සතර කෝරළ මහදිසාවේ ගල්බොඩ කෝරළයේ එගොඩපොත පත්තුවට ය. අතීතයේ පටන් පදීදොර විහාරය වැදගත් සිද්ධස්ථානයක් වශයෙන් පෙනීයන්නේ ලක්දිව පැරණි අධ්‍යාපනය තුළ වනපොත් කරවන ලද මූලික ග්‍රන්ථ අතරට අයත් නම්පොත හෙවත් විහාර අස්නේ ‘පදීදොර’ නාමය සඳහන් වන හෙයිනි[1]. ‘පදී’ යනුවෙන් හඳුන්වනු ලබන්නේ වෙළෙඳපොළයි[2]. ඒ අනුව, පුරාණයේ වෙළෙඳපොළක්

[1] සාරානන්ද හිමි, පන්නිල සහ සරණංකර හිමි, ඕපාත (1956), *විවරණ සහිත නම් පොත හෙවත් විහාර අස්න*, පිටිගල, තිස්ස ගුණසේකර, 28 පිටුව

[2] *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය* ද්විතීය භාගය (2011), සෝරත හිමි, වැලිවිටියේ (සම්.), කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 552 පිටුව



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

පැවතීම හෝ වෙළෙඳපොළක් සඳහා ප්‍රවේශය වැටී තිබීම හේතුවෙන් 'පදීදොර' යනුවෙන් මෙම ප්‍රදේශය හඳුන්වන ලද බව පෙනේ. පදීදොර විහාරයේ විහාර කර්මාන්ත සිදුකොට එහි නඩත්තුව උදෙසා ගම්වර පූජා කිරීම සම්බන්ධ තොරතුරු ඇතුළත් තඹ සන්නසක් විහාරය සතුව පවතී. 'පදීදොර තඹ සන්නස' නමින් ප්‍රකට මෙම සන්නස ප්‍රදානය කරන ලද්දේ 'ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු' නම් රජතුමා විසින් යැයි එහි සඳහන් වේ. පදීදොර තඹ සන්නසේ සඳහන් විහාර අංග වර්තමානය වන විටත් විහාර පරිශ්‍රයේ දී දැකගත හැකි ය.

## 2. ක්‍රමවේදය

පදීදොර තඹ සන්නස ප්‍රදානය කරන ලද රජතුමා නිශ්චිතව හඳුනාගැනීමේ අරමුණ ඇතිව සිදු කළ මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය වශයෙන් යොදාගන්නා ලද්දේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. එහිදී පදීදොර තඹ සන්නස ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් යොදා ගැනිණි. සන්නසේ අන්තර්ගත කරුණුවල අර්ථ නිරූපණය සහ විග්‍රහ කිරීම් වෙනුවෙන් ද්විතියික සාහිත්‍ය මූලාශ්‍රය ගණනාවක් යොදාගන්නා ලදී. ඒ අතරින් පදීදොර රජමහ විහාරයේ ඉතිහාසය පිළිබඳ ඇති ගැටලු කිහිපයක් නිරාකරණය කරගැනීමට උපකාරී වූයේ වර්ෂ 1973 දී ප්‍රකාශයට පත් කරන ලද *හිඟුල රජමහ විහාර ඉතිහාසය* නම් කෘතියයි. මීට අමතරව තොරතුරු එක්රැස් කරගැනීම සඳහා යොදාගත් අනෙක් ක්‍රමවේදය වූයේ සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. ඒ යටතේ පදීදොර රජමහ විහාරාධිපති පූජ්‍ය කොටගේපිටියේ ආනන්ද හිමියන්ගෙන් මුඛ පරම්පරාගතව පැවත එන වැදගත් තොරතුරු කිහිපයක් ලබාගැනීමටත්, ඒවා සාහිත්‍ය මූලාශ්‍රය සමග සැසඳීමටත් අවස්ථාව උදාවිය.

පදීදොර තඹ සන්නස පිළිබඳ පළමුවරට තොරතුරු වාර්තා කරන්නේ කෑගලු දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ගවේෂණයක නිරත වූ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් එච්.සී.පී. බෙල් විසිනි. සන්නසේ අන්තර්ගතය පිළිබඳ කෙටි විස්තරයක් දක්වන බෙල් එය ප්‍රදානය කළ රජතුමා නිශ්චිතව හඳුනාගැනීමට කටයුතු කොට නොමැත. වර්ෂය දෝෂ සහිතව නිර්වචනය කර තිබීම ඊට හේතුවක් වූවා විය හැකි ය.[3] එසේම පදීදොර තඹ සන්නසේ සම්පූර්ණ පෙළ පළමුවරට ප්‍රකාශයට පත්වන්නේ මෙම ලිපියේ ලේඛකයා සහ හෙම්මාතගම පියදස්සි හිමියන් විසින් සම්පාදිත *විවරණ සහිත විහාර අස්න හෙවත් නම්පොත* - ප්‍රථම භාගය නම් කෘතියෙනි.

## 3. ප්‍රතිඵල සහ සාකච්ඡාව

### 3.1. පදීදොර තඹ සන්නසේ භෞතික තොරතුරු

පදීදොර තඹ සන්නස සඳහා යොදාගෙන තිබෙන තඹ තහඩුව දිගින් අඟල් 15ක් සහ පළලින් අඟල් 2ක් පමණ වේ. එහි එක් පසෙක පේළි 7 බැගින් වේ. මෙයින් ඉදිරිපස දකුණු කෙළවර අඟල් 2ක් සහ වම් කෙළවර අඟල් 1/2ක් පමණ ද, පසුපස දකුණු සහ වම් කෙළවර අඟල් 1 1/2 පමණ බැගින් ද ඉඩක් අත්හැර පෙළ සටහන් කර තිබේ. සන්නසේ ඉදිරිපස දකුණු කෙළවර ඉර සඳ සලකුණු සහ ඊට පහළින් වෘත්තයක් සහ ඒ මධ්‍යයේ වක්‍ර හැඩ නිමවමින් දිවෙන රේඛාවකි. ඇතැම් විට එය රජතුමා අත්සන වන්නට පුළුවන. මනාව ඔපමට්ටම් කර තිබෙන තඹ තහඩුවේ පැහැදිලිව සහ ගැඹුරට අකුරු කොටා තිබේ (ඡායාරූපය 01).

### 3.2. පදීදොර තඹ සන්නසේ පෙළ

ශ්‍රී සඞමීම චක්‍රවත්‍ථී සවාමි අප මහා ගෞතම තථාගතයංගේ ප්‍රතම බෝධියෙහි පටන් එක්වාදහස් අටසිය අටලොස් අවුරුද්දක් ඉකුත් ෴ අතීකක්‍රමනයෙන් මහාවශ පැවත ශ්‍රී ලංකාවිපොත්පතති කොට පැමිනි ෴ සවසතිශශ්‍රී වෛවසසුත මනු වශභරන භගිරත දිලිපදරන ධසරත ධසරාමරත කුසලාන් තිථිය ප්‍රමුඛ බොධිවශොත්භුත රාජකුල කුලකක්‍රමානුගත සුමිතතරාජ පවිතත්‍ර අභිමාන ශ්‍රී බුධ බොධිසත්‍වව **ශ්‍රී සඟබෝ ශ්‍රී භුවනෛකබාහු** මහාරාජොතතම උතුම් ශ්‍රී මහා කරුණාවෙන් සතර කොරලෙන් ගල්බඩ කොරලේ බද උතුරාලෙ දාසහවතත දොඩමුනන කපපාගොඩ මේ සතරමාඉමට මැදි වූ **පදීදොර** ගල්ලෙන කටාරකොටා එහි වට කටුකොවුල් පෙරලවා පදලමින් කරවා ගල්බිචචි බදවා මීල මකර පත්ම කුමුදු සහිත ප්‍රතිමා හා බුඩරූප විචිත්‍ර චිතත්‍ර

[3]. බෙල්, එච්.සී.පී. (2005), *ලංකා පුරාවිද්‍යා ගවේෂණය - සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව*, එඩ්මන්ඩ්, කොත්මලේ කේ.බී.ඒ. (පරි.), කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, 88 පිටුව


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

කරුමාන්තයෙන් නේතත්‍රපප්‍රතිෂ්ටා කරවා කළුපඩාන කුරු දැයෙන් ගල උඩ දාගොබකකරවා බොධි පිහිටුවා ෴ ඉර සඳ ආඥා චකක්‍ර ශංක සිලාලෙක අනගඝී නවරතන රන්මිනිවැට පහන් විසුධි සුධි බුඩ පූජාවටනාපස බවට රත්මොලෙකුබුර බිජු අමුනත් මලලැව කුබුර බිජු තුංපැලත් අඹකුබුර බිජු දෙපැලත් කලුන්‍දාව බිජු දැමුනත් ගලහිටිකුබුර බිජු තුනුමුනත් අරමන්බඩකුබුර බිජු පස්පැලත් නැගෙනහිර දික්භාගයෙන් ඉරහඳ කෙටූ හිටිගලෙන් මා ඔයෙන් මෙගොඩත් ඒ ඔයට මාන වූ දකුනු දික්භාගයෙන් බ්‍රහමල ඇලෙන් මෙගොඩත් ඒ ඇලට මාන වූ බස්නාහිර මස්ඇලෙලන් මෙගොඩත් උතුරු දික්භාගයෙන් බමුනුදෙනිය ඉරහඳ කෙටූ ගලෙන් මෙපිටත් විහාරෙට පුද ඕලකකම් පවතිනා ශටියට **කපපාගොඩ බ්‍රහමවඨීන ඒකනායක සාමිඬ** බැනා වන **කලයාන බමුනු සුමේධර සාමනේර සාමිඬ** ප්‍රතයදාන ප්‍රතිග්‍රහ කරවා මෙසේ කලා මීට අවුල් විපතති කල කී කෙනෙක් ඇතනම් මහාබෝ පලා ගිනි තැපපාහු වෙති සතර කරාවෙ මසුමමරා පවුගනනාහු වෙති කාවනුවෙ බත් කැවාහු වෙති බලු කපුටු උපදිනාහු වෙති මොලං කඩ පනුවන් උපදනාහු වෙති සඤ්වය කාලසුත්තය සඟාතය රවුරවය මහාරවුරවය තාපය ප්‍රතාපය අවිචියෙහි දුක් විඳ ගොඩ නොදැක්කහු වෙති මතු මයිත්‍රී බුදුන් නොදක්නාහු නම් වෙත් ෴ වෛශාක මාසේ පුර පසලොස්වක් නම් තිථිය ලත් බ්‍රහස්පතින්‍දා මෙම දින නවරතනාදිපති මඬප මගුල් මඩුවෙදී මම වදාල සිවමමශාමම ෴ ෴ ෴ [4]

### 3.3 පදීදොර තඹ සන්නසේ අන්තර්ගත තොරතුරු විමර්ශනය

ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු නම් රජතුමා විසින් සතර කෝරළ මහදිසාවේ ගල්බොඩ කෝරළය බද පදීදොර නම් විහාරයේ විහාර කර්මාන්ත සිදු කරවා, ඊට ගම්වර පූජා කළ අන්දම පිළිබඳ තොරතුරු පදීදොර තඹ සන්නසේ අන්තර්ගත වේ. ඊට අනුව රජතුමා විසින් විහාර පරිශ්‍රයේ පිහිටි ගල්ලෙනේ කටාර කොටවා පිරිසිදු කරවීමෙන් අනතුරුව ශිලා බිත්ති බඳවා බුද්ධ ප්‍රතිමා, අනෙකුත් ප්‍රතිමා සහ සිතුවම් කර්මාන්ත කරවනු ලැබ තිබේ;

> ...**පදීදොර** ගල්ලෙන කටාරකොටා එහි වට කටුකොවුල් පෙරලවා පදලමින් කරවා ගල්බිච්චි බදවා මීල මකර පත්ම කුමුදු සහිත ප්‍රතිමා හා බුඩරූප විචිත්‍ර චිතත්‍ර කරුමාන්තයෙන් නේතත්‍රපප්‍රතිෂ්ටා කරවා....

ඊට අමතරව ගල්ලෙන මත දාගැබක් බැඳවීමටත්, විහාර පරිශ්‍රයේ බෝධි වෘක්ෂයක් රෝපණය කරවීමටත් රජතුමා කටයුතු කළ හෙයින් පදීදොර විහාරය ශාරීරික, උද්දේසික සහ පාරිභෝගික යන ත්‍රිවිධ චෛත්‍යවලින් සමන්විත වී තිබේ.

විහාර පරිශ්‍රයේ සංඝාවාසයට වම්පසින් තරමක් උස් භූමිය බෝ මළුව වශයෙන් සකස් කරගෙන ඇත්තේ මනාව කපා ඔපමට්ටම් කළ ශිලා කුට්ටි යොදා පනාබැම් බැඳවීමෙනි. බෝ මළුව මධ්‍යයේ පැරණි බෝධි වෘක්ෂයකි. ඒ වටා පැරණි ස්වභාවයක් ගන්නා බෝධි ප්‍රාකාරය ඉදි කර ඇත්තේ මනාව කපා ඔපමට්ටම් කළ ශිලා කුට්ටි භාවිත කොටගෙන ය. මෑතභාගයේ දී ඒ මත අටවිසි බුද්ධ ප්‍රතිමා සහිත කුටි පෙළක් ඉදිකර තිබේ (ඡායාරූපය 03).


බෝ මළුවට මදක් පහළින් ඇති ගල් පර්වතයේ දිගින් අඩි 15ක් සහ පළලින් අඩි 09ක් පමණ වූ කටාර සහිත ලෙන තුළ ලෙන් විහාරය ඉදිව තිබේ. එය අන්තරාලය සහ ගර්භගෘහය යන කොටස්වලින් සමන්විත වේ. අන්තරාලයට පිවිසෙන ද්වාරයේ දාරුමය උළුවස්සකි. පසු කාලීන ව ලෙන් විහාරයේ ආරක්ෂාව වෙනුවෙන් අන්තරාලය ඉදිකර ඇත. අන්තරාලයේ සිට ගර්භගෘහයට පිවිසෙන ද්වාරයේ ශිලා උළුවස්සකි.

ගර්භගෘහයේ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව වශයෙන් නිර්මාණය කර ඇත්තේ අඩි 03 1/2ක් පමණ උසැති ධ්‍යාන මුද්‍රාවෙන් යුතු හිඳි බුද්ධ ප්‍රතිමාවකි. ප්‍රතිමාවට ඉහළින් අලංකාර මකර තොරණක් සහ දෙපසින් චාමරධාරී ප්‍රතිමා නිර්මාණය කර තිබේ (ඡායාරූපය 04).


ගර්භගෘහයේ බිතුසිතුවම් සඳහා වස්තු විෂය වී ඇත්තේ සූවිසි විවරණයයි. මීට අමතර ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවේ දෙ පස දෑ අගසව්වන්ගේ විශාල ප්‍රමාණයේ සිතුවම් දෙකකි. වියන් තලය සැරසී ඇත්තේ මල් ලියකම්

[4]. පදීදොර සිරිසඟබෝ ශ්‍රී බුවනෙකබාහු රජමහ විහාරාධිපති කොටගේපිටියේ ආනන්ද හිමියන්ගේ අනුග්‍රහයෙනි. මෙම පෙළ ලේඛකයා විසින් කියවා සටහන් කරගන්නා ලද්දකි.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk




සිතියම 01. පදිදොර රජමහ විහාරයේ පිහිටීම https://www.google.lk/maps



ඡායාරූපය 01. පදිදොර තඹ සන්නසේ ඉදිරිපස සහ පසුපස දර්ශනය (පහත) (ඡායාරූප අයිතිය කර්තෘ සතුය)

මෝස්තරවලිනි. මෑතභාගයේ සිදු කර තිබෙන ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් මහනුවර යුගයේ කලා ලක්ෂණ යටතේ නිර්මාණය වී තිබූ ප්‍රතිමා සහ සිතුවම් සියල්ලම නවීකරණය වී තිබේ.

ලෙන් විහාරය සහිත පර්වතය මුදුනේ පදිදොර තඹ සන්නසේ සඳහන් ස්තූපය පිහිටා තිබේ. උසින් අඩි 9ක් පමණ වූ ඝණ්ඨාකාර හැඩැති ස්තූපය සඳහා ශිලා කුලුනු සතරක් යොදාගෙන කුළුදාගෙයක් ඉදිකර තිබේ. ශිලා කුලුනු එකිනෙක යා කරමින් කුළුදාගෙය වටා ඉදිව තිබෙන ප්‍රාකාරයේ ස්ථාන කිහිපයක ම පහන් දැල්වීම සඳහා සැකසූ කුහර දැකගත හැකිය (ඡායාරූපය 05). ස්තූපය වන්දනා කිරීම සඳහා පර්වත මුදුනට පිවිසීම උදෙසා මනාව කපා ඔපමට්ටම් කළ ශිලා කුට්ටි යොදාගෙන තැනූ පියගැටපෙළකි.

විහාර කර්මාන්ත අවසානයේ රජතුමා විසින් පහත සඳහන් ගොඩමඩ ඉඩම් පූජා කරනු ලැබ ඇත්තේ විහාරයේ බුද්ධ පූජාව වෙනුවෙනි;


- රත්මොලේ කුඹුර - අමුණක්
- මල්ලෑව කුඹුර - තුන් පැලක්
- අඹකුඹුර - දෙපැලක්
- කලුන්දාව - අමුණු දෙකක්
- ගලහිටි කුඹුර - අමුණු තුනක්
- අරමන්බඩ කුඹුර - පස් පැලක්

නැගෙනහිරින් ඉරහඳ කෙටූ හිටිගලත්, දකුණින් බ්‍රහ්මල ඇළ, බස්නාහිරින් මස්ඇල්ල සහ උතුරින් බමුණුදෙණියේ ඉර හඳ කෙටූ ගලට මායිම් වූ භූමිභාගය ඉහතින් සඳහන් ගොඩමඩ ඉඩම්වලින් විහාරයේ දෛනික පුද-පූජා පැවැත්වීම සඳහා රජතුමා විසින් තඹ සන්නස පූජා කරන ලද්දේ කප්පාගොඩ බ්‍රහ්මවර්ධන ඒකනායක නම් හිමියන්ගේ බෑණනුවන් වූ කල්‍යාණ බමුණු සුමේධර නම් සාමණේර හිමියන්ට ය.


විහාර පූජාවට බාධා පමුණුවන්නන් හට සිදු කරන ශාප පාඨයකින් පදිදොර තඹ සන්නස අවසන් වේ. ශාප පාඨය ආරම්භ වන්නේ විහාර පූජාවට බාධා පමුණුවන්නන් සිදු කරගන්නා වරදේ බරපතළ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ස්වභාවය පෙන්වාදෙන 'මහාබෝ පලා ගිනි තැප්පාහු වෙති' සහ 'සතර කරාවෙ මසුන් මරා පවුගන්නාහු වෙති' යන වාක්‍ය යෙදීමෙනි.



ඡායාරූපය 03. පදීදොර රජමහ විහාරයේ බෝධි වෘක්ෂය (ඡායාරූප අයිතිය කර්තෘ සතුය)



ඡායාරූපය 02. පදීදොර සිරිසඟබෝ ශ්‍රී බුවනෙකබාහු රජමහ විහාරය (ඡායාරූප අයිතිය කර්තෘ සතුය)

මෙහි මහබෝ නමින් හඳුන්වන්නේ ශ්‍රී මහා බෝධියයි. බුදුන් වහන්සේ බෝධි වන්දනාව අනුදැන වදාළ හෙයින් බුදුන් හා සමකොට ශ්‍රී මහා බෝධිය වන්දනා කිරීම බෞද්ධයන්ගේ සිරිතයි. මෙනිසා බෝධිය යනු පාරිභෝගික චෛත්‍යයකි. එවන් පූජනීය වස්තුවකට ආයුධයක් තැබීම පවා සැලකෙන්නේ අතිශය දරුණු අපරාධයක් වශයෙනි.[5]

සතර කරාවේ මසුන් මැරීම යනුවෙන් අදහස් කෙරෙන්නේ සතර දිශාවේ ඇති මුහුදේ මසුන් මැරීමයි.[6] මහ බෝ පලා ගිනි තැපීමට සාපේක්ෂව මෙය අඩු මට්ටමේ අපරාධයක් වුවත් එයින් ජනිත වන්නේ මහත් අකුසලයකි.



ඡායාරූපය 04. පදීදොර ලෙන් විහාරයේ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව (ඡායාරූප අයිතිය කර්තෘ සතුය)

පදීදොර විහාර පූජාවට බාධා පමුණුවන්නන් හට සිදු කර තිබෙන ශාප කිහිපය මෙසේ පෙළගැස්විය හැකිය;

[5]. කුලතුංග, ටී.ජී. (2005), *අභිලේඛන ශාපපාඨ*, නුගේගොඩ, කර්තෘ ප්‍රකාශන, 62 පිටුව
[6]. එම, 48 පිටුව


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

- කාවනුවේ බත් කැවාහු වෙති
- බලු කපුටු උපදිනාහු වෙති
- මොලං කඩ පනුවන් උපදනාහු වෙති
- සංජීවය කාලසුත්තය සංගාතය රවුරවය මහාරවුරවය තාපය ප්‍රතාපය අවීචියෙහි දුක් විඳ ගොඩ නොදැක්කාහු වෙති
- මතු මෛත්‍රී බුදුන් නොදක්නාහු වෙති



**ඡායාරූපය 05. පදීදොර රජමහ විහාරයේ කුළුදාගෙය (ඡායාරූප අයිතිය කර්තෘ සතුය)**

මෙහි 'කාවනුවේ බත් කැවාහු වෙති' යනුවෙන් අදහස් කරන්නේ කවුඩන් සඳහා බත් දමන භාජනයේ ආහාර ගැනීමට සිදුවන බවයි. ඉන් අදහස් වන්නේ ඉතා පහත් තත්ත්වයකට ඇද වැටෙන බවයි. එහිම දිගුවක් වශයෙන් බලු කපුටුව උපදින බව සඳහන් වේ. අනුරාධපුර යුගයේ පටන් විහාර පූජාවලට අදාළ සෙල්ලිපිවල බලු කපුටු රුව කොටා තිබීම සුලබ ලක්ෂණයකි. නිවෙස්වලින් ඉවතලන ඉඳුල් බත් කෑමට සිදුවන, කිසිදා නොසංසිඳෙන කුසගින් ඇති මෙවන් සතකුව ඉපදීම අතිශය අභාග්‍ය සම්පන්න තත්ත්වයක් ලෙෂ සැලකූ බව මෙයින් පෙනේ.

මෙහි 'මොළං/මොළග' යනුවෙන් හඳුන්වන්නේ කුණු මඩ ආදිය පිරුණු වළ හෝ කාණුවයි.[7] ඒ අනුව 'මොලං කඩ පනුවන් උපදනාහු වෙති' යනුවෙන් මෙහි අදහස් කරන්නේ කුණු වළක හෝ කුණු කාණුවක පණුවන් වී උපදින බවයි. සංජීව, කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහා රෞරව, තාප, ප්‍රතාප සහ අවීචිය යනු අට මහා නිරයයි. අට මහානිරයේ දී අධිකව දුක් පීඩා විඳීමට සිදුවන බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.[8]

අවසාන ශාපපාඨය වශයෙන් දැක්වෙන්නේ මෛත්‍රී බුදුන් දැකීමට නොහැකි වන බවයි. මහා භද්‍ර කල්පයේ පහළ වන අවසන් බුදුවරයා වශයෙන් සැලකෙන්නේ මෛත්‍රී බුදුන් වහන්සේ ය. උන්වහන්සේ දැකීමට නොලැබීම බලවත් අභාග්‍යයක් බව බෞද්ධ පිළිගැනීමයි.[9] කුරුණෑගල යුගයේ *මෙතේ බුදුසිරිත හෙවත් අනාගතවංසය* වැනි ග්‍රන්ථ සම්පාදනය වන්නේ ද මෙම පිළිගැනීම ඔස්සේ මිනිසා දුශ්චරිතයෙන් මුදවා සුචරිතයේ යෙදවීමේ අභිප්‍රාය ඇතිව ය.[10]

විහාර පූජාව සහ විහාර සන්තක දේපළ සඳහා බාධා පමුණුවන්නන් හට හිමිවන දුර්විපාක පිළිබඳ භීතියක් දැනවීම ඉහත සියලු ශාපපාඨවල ප්‍රධාන අරමුණ වන්නට ඇති බවයි. එමගින් විහාර දේපළ ආරක්ෂා කරගැනීම පහසුවක් වන්නට ඇත. එසේම ජනතාව සුචරිතයේ යෙදවීමට ද එය උපකාරයක් වූ බව පිළිගත හැකි ය.

## 3.4. පදීදොර තඹ සන්නස ප්‍රදානය කළ රජතුමා සහ කාලවකවානුව

පදීදොර තඹ සන්නස ප්‍රදානය කළ රජතුමා හඳුන්වා ඇත්තේ 'වෛවසුත මනුවංශභරණ භගිරථ දිලිපදරන දසරථ දසරාමරථ කුසලාන් තිපීය ප්‍රමුඛ බෝධිවංශෝත්භූත රාජකුල කුලක්‍රමානුගත සුමිත්‍රරාජ පවිත්‍ර අභිමාන ශ්‍රී බුද්ධ බෝධිසත්ව ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු මහරජතුමා' යනුවෙනි. සන්නස් ප්‍රදානය කළ වර්ෂය කවර වර්ෂ ක්‍රමයෙන්දැයි නිශ්චිතව සඳහන් නොවන හෙයින් මෙනමින් හැඳින්වූයේ කිනම් රජතුමා ද යන වග නිශ්චය කිරීම දුෂ්කර කාර්යයක් වී තිබේ.

---

7. *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය* ද්විතීය භාගය (2011), 801-802 පිටු
8. කුලතුංග (2005), 33-39 පිටු
9. එම, 46-47 පිටු
10. සන්නස්ගල, පුඤ්චි බණ්ඩාර (2013), *සිංහල සාහිත්‍ය වංශය*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 248-249 පිටු


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk

පදීදොර සන්නස ආරම්භයේ වර්ෂය දක්වා ඇත්තේ මෙසේ ය;

> ශ්‍රී සඬම්ම චක්‍රවත්‍ර් සවාමි අප මහා ගෞතම තථාගතයංගේ ප්‍රතම බෝධියෙහි පටන් එකවාදහස් අටසිය අටලොස් අවුරුද්දක් ඉකුත් ෴ අතීකක්‍රමනයෙන් මහාවශ පැවත ශ්‍රී ලංකාවිපොත්පතති කොට පැමිනි ෴

බෙල් මෙහි වර්ෂය හඳුනාගෙන ඇත්තේ පහත අන්දමට ය;

> සන්නස දින ගන්වා ඇත්තේ නවරත්නාධිපති මඟුල් මඩුවේදී සිරිමා බෝ සමිඳුන් (මෙරටට) වැඩම කරවීමේ සිට වසර 1818ක් ඉකුත් වූ වෙසක් මස පුර පසළොස්වක් ගුරු දිනදී ය. තව ද කාලව්‍යතික්‍රමයකි. ශ්‍රී මහා බෝධිය ලක්දිවට ගෙන ආවේ ක්‍රි.පූ. 307දී ය. මේ නිසා සන්නසෙහි දිනය (1818-307) ක්‍රි.ව. 1511 විය යුතු ය. එහෙත් සත්වන බුවනෙකබාහු රජ ක්‍රි.ව. 1521 වන තුරු රාජ්‍ය පාලනය ආරම්භ කොට නොතිබිණ.[11]

පදීදොර තඹ සන්නසේ සඳහන් විස්තරයට අනුව හඳුනාගත හැක්කේ බුදුන් වහන්සේගේ ප්‍රථම බෝධියේ පටන් වර්ෂ 1818ක් ඉක්මයෑමෙන් පසුකාලයක ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු රජතුමා රාජ්‍ය කළ බවයි. මෙහි 'ප්‍රථම බෝධිය' වශයෙන් හඳුන්වන්නේ බුද්ධත්වයයි. බුද්ධ පරිනිර්වාණයේ පටන් බුද්ධ වර්ෂ ගණනය කිරීම පිළිගත් සම්ප්‍රදාය වුව ද, බුද්ධත්වයේ පටන් බුද්ධ වර්ෂ ගණනය කිරීමේ අවස්ථා කිහිපයකට උදාහරණ දඹදෙණි යුගයෙන් හඳුනාගත හැකි ය. තත් යුගයේ රචිත *හත්ථවනගල්ලවිහාරවංසය, පූජාවලිය* සහ *යෝගාර්ණවය* වැනි ග්‍රන්ථවල එන බුදුන්ගේ බෝධියෙහි හෙවත් බුද්ධත්වයේ පටන් බුද්ධ වර්ෂ ගණන් ගැනීම පිළිබඳ අමරදාස ලියනගමගේ මෙලෙස පැහැදිලි කරයි;

> දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය කාලයේ දී රචනා කරන ලද *හත්ථවනගල්ලවිහාරවංසයෙහි*, එතුමා බුදුන්ගේ බෝධියෙහි පටන් අවුරුදු එක්දහස් අටසිය විසිහතරක් ගිය තැන අභිෂේක ලැබූ බව දැක්වෙයි. මෙම පාලි ග්‍රන්ථයේ සිංහල අනුවාදවල සඳහන් වන්නේ බුද්ධ වර්ෂයෙන් එක්දහස් අටසිය විසිහතරක් ගෙවී ගිය කල්හි (දෙවන) පරාකමබාහු රජතුමාගේ අභිෂේකය සිදු වූ බවයි. මෙහිදී *හත්ථවනගල්ලවිහාරවංසයෙහි* බුද්ධ වර්ෂය යොදා ඇත්තේ සාමාන්‍ය පිළිවෙතට අනුව බුද්ධ පරිනිර්වාණයේ සිට වර්ෂ ගණන් ගැනීමෙන් නොව, බෝධිය හෙවත් බුද්ධත්වයේ ආරම්භක ස්ථානය ලෙස සලකා ගෙන ය. පොදු භාවිතයට තරමක් වෙනස් පිළිවෙතක් මෙහි යෙදී ඇතත් එය අනුසාරයෙන් ඉදිරිපත් කෙරෙන අභිෂේක වර්ෂය කෙරෙහි සැකයක් ඇතිවීමට ප්‍රබල හේතුවක් නොපෙනෙයි.
>
> බැලූ බැල්මට මේ පිළිවෙතෙහි අපූර්වත්වයක් දක්නට ඇතත්, ඇත්ත වශයෙන් එය එසේ නොවන බව කරුණු විමසීමෙහිදී පෙනීයයි. මෙකල වැඩ විසූ මයුරපාද ස්ථවිරපාදයන් වහන්සේ විසින් රචිත *පූජාවලිය* හා *යෝගාර්ණවය* යන ග්‍රන්ථද්වයෙහිම බුද්ධ වර්ෂය බුද්ධත්වයේ සිට ගණන් ගැනීමේ සිරිත දක්නට ලැබේ.
>
> බුද්ධත්වයේ සිට පරිනිර්වාණය දක්වා කාලය වර්ෂ හතලිස්පහකින් යුක්ත වූ බවට ප්‍රකට කරුණකි. එබැවින් *හත්ථවනගල්ලවිහාරවංසයේ* බුද්ධත්වයේ සිට ගණන් ගෙන ඇති වර්ෂය පරිනිර්වාණයෙන් ගණන් ගන්නා ප්‍රකට බුද්ධ වර්ෂයට පරිවර්තනය කළ විය ලැබෙන ප්‍රතිඵලය බුද්ධ වර්ෂ 1779 (1824-45=1779)යි.[12]

ඒ අනුව බලන කල පදීදොර සන්නසේ සඳහන් වර්ෂය උදාවී ඇත්තේ බුද්ධත්වයෙන් වර්ෂ 1818කට පසුව ය. බුද්ධත්වයේ සිට පරිනිර්වාණය දක්වා කාලය වසර 45කි. එබැවින් පදීදොර තඹ සන්නසේ එන වර්ෂය, බුද්ධ පරිනිර්වාණයේ සිට ගණන් ගන්නා බුද්ධ වර්ෂයට පරිවර්තනය කළ විට ලැබෙන වර්ෂය නම් බුද්ධ වර්ෂ 1773 (1818-45=1773) යි. එය ව්‍යවහාර වර්ෂ ක්‍රමයට අනුව වර්ෂ 1229 ලෙස ගැනේ. මෙම කාලපරිච්ඡේදය තුන්වන විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1232-1236) විසින්

[11]. බෙල් (2005), 88 පිටුව

[12]. ලියනගමගේ, අමරදාස (2002), *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය*, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 151-152 පිටු


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කාලිංග මාඝට එරෙහිව සේනා සංවිධානය කරමින් සිටින කාලපරිච්ඡේදයයි. මෙනිසා එකී කාලසීමාවට පසුව රජ පැමිණි බුවනෙකබාහු නම් රජකු විසින් පදීදොර තඹ සන්නස පූජා කරන ලද බව පැහැදිලි ය. එහෙත් බුවනෙකබාහු නමින් රජ පැමිණි රජවරු සත්දෙනකු සිටින හෙයින් අදාළ රජතුමා නිශ්චිතව හඳුනාගැනීම දුෂ්කර කටයුත්තකි.

මෙම ගැටලුව විසඳාගැනීම සඳහා කිසියම් ආලෝකයක් ලැබෙනුයේ විහාර සඟ පරපුර පිළිබඳ පවතින තොරතුරු ඇසුරෙනි. පදීදොර තඹ සන්නසේ සඳහන් වන අන්දමට විහාර ලාභය පූජා කර ඇත්තේ කප්පාගොඩ බ්‍රහ්මවර්ධන ඒකනායක හිමියන්ගේ බෑණනුවන් වූ කල්‍යාණ බමුණු සුමේධර නම් සාමණේර හිමියන්ට ය. විහාර සඟ පරපුර පිළිබඳ තොරතුරුවලට අනුව කප්පාගොඩ බ්‍රහ්මවර්ධන ඒකනායක හිමියන් පැවත එන පරපුර සුවිශේෂී එකකි. කුරුණෑගල සතරවැනි පරාක්‍රමබාහු රජ දවස (ක්‍රි.ව. 1302-1326) දෙවිනුවර සිට විෂ්ණු දෙවියන්ගේ රත්සඳුන් ප්‍රතිමාව අලුත්නුවරට වැඩම කරවන පෙරහැරේ ඉරහඳ කොඩිය රැගෙන ගමන් කරන ලද්දේ චන්ද්‍රවංක සහ භුජංගසිංහ නම් බමුණු තරුණයන් දෙදෙනා විසිනි. පසුව කප්පාගොඩ ග්‍රාමයේ පදිංචි වූ භුජංගසිංහ බ්‍රාහ්මණයාගේ පරපුරෙන් කප්පාගොඩ බ්‍රහ්මවර්ධන ඒකනායක හිමියන් පැවත එන බව කියැවේ. ඉහත තොරතුරුවලට අනුව උන්වහන්සේගේ බෑණනුවන් වූ කල්‍යාණ බමුණු සුමේධ හිමියන් වැඩසිටි බව කියැවෙන්නේ කෝට්ටේ සයවැනි බුවනෙකබාහු (ක්‍රි.ව. 1470-1478) දවස ය.[13]

කෝට්ටේ සයවැනි බුවනෙකබාහු දවස නිකුත් කළ සන්නස් සහ පිහිට වූ සෙල්ලිපි කිහිපයක රජතුමාගේ නම සඳහන් වන්නේ මෙසේ ය;

- අරන්කැලේ (පළමුවන) සන්නස - මහබෝ වඩවා ආ සිරිසඟබෝ වංශයෙන් අවිච්ඡින්නව පැවත ආ ශ්‍රී බුවනෙකබාහු මහරජාණෝ [14]
- අරන්කැලේ (දෙවන) සන්නස - ශ්‍රී මනු මන්‍ධාතු භරථ භගීරථාදී සූර්යවංශොද්භූත සුමිත්‍රරාජ පවිත්‍රාභිජාත නවරත්නාධිපති ත්‍රිසිංහළාධිපති ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී භුවනෛකබාහු චක්‍රවර්ති ස්වාමි [15]
- දැදිගම පුවරු ලිපිය - මහාසම්මත පරම්පරානුයාත සූර්යවංශොත්භූත ශ්‍රී පරාක්‍රමබාහු මහාරාජාධිරාජ නන්දන ත්‍රිසිංහලාධීශ්වර නවරත්නාධිපති ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී භුවනෙකබාහු චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ [16]

මේ අනුව බලන කල පදීදොර තඹ සන්නස ප්‍රදානය කළ රජතුමාගේ නාමය සහ කෝට්ටේ සයවැනි බුවනෙකබාහු රජතුමාගේ නාමය අතර සාම්‍යයක් හඳුනාගත හැකිය.

ඉහත සඳහන් දැදිගම පුවරු ලිපිය සයවැනි බුවනෙකබාහු රජතුමා විසින් පිහිටුවන ලද්දේ අභයදාන සෙල්ලිපියක් වශයෙනි. රජතුමාට එරෙහිව කැරලි ගැසූ සතර කෝරළයේ ජනතාව යටත් කරගැනීමෙන් පසුව ඔවුන්ට අභයදානය දීම සඳහා වික්‍රමසිංහ අධිකාරී නම් රාජනිලධාරියා විසින් කොටවන ලද රාජාඥාවක් එහි අන්තර්ගත වේ.[17] මෙනිසා සතර කෝරළයේ බලය තහවුරු කරගැනීම සහ සතර කෝරළයේ ජනතාව පක්ෂපාතී කරගැනීමේ අරමුණ ඇතිව සයවැනි බුවනෙකබාහු රජතුමාගේ අනුග්‍රහය පදීදොර විහාරයට හිමිවන්නට ඇතැයි පිළිගත හැකිය.

## 5. සමාලෝචනය

*නම්පොත හෙවත් විහාර අස්නට* අන්තර්ගත පදීදොර සිරිසඟබෝ ශ්‍රී බුවනෙකබාහු රජමහ විහාරය දිගු ඉතිහාසයක් සහිත විහාරස්ථානයකි. එහි විහාර කර්මාන්ත කරවා ගම්වර ප්‍රදානය කිරීමක් පිළිබඳ තොරතුරු අන්තර්ගත පදීදොර තඹ සන්නස, විහාර ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් කරුණු කිහිපයක් හෙළිකරයි. ඊට අනුව ලෙන් විහාරය, දාගැබ සහ බෝධි වෘක්ෂය පිහිටුවා විහාරයේ නඩත්තුව සඳහා ගම්වර පූජා කර ඇත්තේ ශ්‍රී සඟබෝ ශ්‍රී බුවනෙකබාහු නම් රජතුමා ය. මෙනමින් හඳුන්වන්නට ඇත්තේ කිනම්

[13]. ධම්මරක්ඛිත හිමි, කෙහෙල්පන්නල (1973), *හිඟුල රජමහ විහාර ඉතිහාසය,* මාවනැල්ල, යූ.ඩබ්. වීරසේකර, 08 පිටුව; පුද්ගල සම්ප්‍රේෂණ - පදීදොර සිරිසඟබෝ ශ්‍රී බුවනෙකබාහු රජමහ විහාරාධිපති කොටගේපිටියේ ආනන්ද හිමි

[14]. තිලකරත්න, ඊ. විමලා (2000), *කීර්ති ශ්‍රී රාජසිංහ රජුන් දෙවා වදාළ ආඳාගල තඹ සන්නස,* පිළියන්දල, කර්තෘ ප්‍රකාශන, 38-40 පිටු

[15]. ජයතිලක, ඩී.බී. (2008), *සිංහළ සාහිත්‍ය ලිපි,* කොළඹ,ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 139-140 පිටු

[16]. බෙල් (2005), 163-165 පිටු

[17]. එම


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk

බුවනෙකබාහු රජතුමා ද යන්න හඳුනාගැනීම දුෂ්කර කාර්යයක් වී ඇත්තේ සන්නසේ වර්ෂය දක්වා තිබෙන ව්‍යාකූල ස්වභාවය හේතුවෙනි.

එහෙත් මෙම පර්යේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් සන්නස නිකුත් කරන ලද කාලසීමාව නිශ්චිතව හඳුනාගැනීමටත්, එහි අන්තර්ගත විහාර සඟ පරපුර සම්බන්ධ තොරතුරු, වෙනත් සන්නස් හා සෙල්ලිපි සාධක සමග සැසඳීමෙන් පදීදොර තඹ සන්නස නිකුත් කරන ලද්දේ කෝට්ටේ සයවැනි බුවනෙකබාහු රජතුමා විසින් යැයි හඳුනාගැනීමටත් පුළුවන.
ඊට අමතරව පැරණි ලක්දිව විහාර දේපළ මහජනතාව භුක්ති විඳීම වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු කිහිපයක් පදීදොර තඹ සන්නසෙන් හඳුනාගත හැකි ය. ඒ යටතේ 'ශාපපාඨ' නමින් හැඳින්වෙන් පාඨ සන්නසේ අවසානයට ඇතුළත් කිරීමෙන් විහාර සන්තක දේපළ භුක්ති විඳීම හෝ ඒවායේ කටයුතුවලට බාධා පමුණුවන්නන් හට හිමිවන දුර්විපාක පිළිබඳ බිය ඇතිකොට විහාර දේපළ ආරක්ෂා කරගැනීම කටයුතු කර තිබෙන බව පෙනේ.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ


- කුලතුංග, ටී.ජී. (2005), *අභිලේඛන ශාපපාඨ*, නුගේගොඩ, කර්තෘ ප්‍රකාශන.
- තිලකරත්න, ඊ. විමලා (2000), *කීර්ති ශ්‍රී රාජසිංහ රජුන් දෙවා වදාළ ආඳාගල තඹ සන්නස*, පිළියන්දල, කර්තෘ ප්‍රකාශන.
- ධම්මරක්ඛිත හිමි, කෙහෙල්පන්නල (1973), *හිඟුල රජමහ විහාර ඉතිහාසය*, මාවනැල්ල, යූ.ඩබ්. වීරසේකර.
- ජයතිලක, ඩී.බී. (2008), *සිංහළ සාහිත්‍ය ලිපි*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,
- බෙල්, එච්.සී.පී. (2005), *ලංකා පුරාවිද්‍යා ගවේෂණය - සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව*, එඩ්මන්ඩ්, කොත්මලේ කේ.බී.ඒ. (පරි.), කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
- ලියනගමගේ, අමරදාස (2002), *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය*, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය* ද්විතීය භාගය (2011), සෝරත හිමි, වැලිවිටියේ (සම්.), කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- සන්නස්ගල, පුඤ්චි බණ්ඩාර (2013), *සිංහල සාහිත්‍ය වංශය*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- සාරානන්ද හිමි, පන්නිල සහ සරණංකර හිමි, ඕපාත (1956), *විවරණ සහිත නම්පොත හෙවත් විහාර අස්න*, පිටිගල, තිස්ස ගුණසේකර.